# දැනුමට අත්වැලක්

## සමානාර්ථ පද (පර්යාය පද)

කිසියම් පදයකට අර්ථයෙන් සමාන අනෙකුත් පද සමානාර්ථ පද වේ.

| පදය | සමානාර්ථ පද |
|---|---|
| 1. අත | කරි, බා, බුජ, බාහු, භුජ, සොඬ, හස්තය |
| 2. අම්මා | ජනනී, මව, මාතා, මෑණි, මෝ |
| 3. අහස | අඹර, ආකාශය, ගගන, ගුවන, නබ, නුබ, නබර, පවන් මග, සුරමග, ගහමග |
| 4. ඇතා | ඇත්, කණේරු, කිරි, ගජ, දත්, නා, නාග, පිණි පා, මතඟ, වරණ, වාරණ, හස්ති |
| 5. ඇස් | ඇස්, කන්, ගෝ, චක්ෂු, නුවන්, නෙත්, සක් |
| 6. ඉරු | හිරු, දිනකර, දිනමිණ, දියනෙත, දිවයුරු, නුබ මිණි, අඳුරු රුපු, ගහමිණි, ගිම්රුස්, දවස්මෑණි, තික්මෙරද |
| 7. ගෙය | අග, අගර, අගාර, අනල, අල. ආලය, ගර, ගෘහය. නිවාසය, නිවෙස, නිල, මැඳුර, වසාර, විමන, විමානය |
| 8. ගඟ | ගංගාව, නදිය, නී, සිඳු, හොය, හෝ |
| 9. ජලය | අප, අඹ, අඹු, උදක, උද, ජලය, තෝ, දල, දිය, නී, පා, පැන්, රස, වස., සලිල, සිලිල් |
| 10. දත් | දද, දන්ත, දළ, දසන, රදන |

11.මුහුද සමුද්‍ර, අනව, අර්ණව, උදදි, දලනිඳු, දලරැස්, දහනා, නිඳු, රුවනාර, සමුදුර, සයුර, සාගර, සිඳු, සිලිලාර

12.මුහුණ වත, වදන, වුවන, මුව

13.ප්‍රසිද්ධ පතළ, පළ, පවර, පසිඳු, පුවතර, ප්‍රකට, ප්‍රසිද්ධ

14.සිංහයා ඇත්රුපු, කෙසර, ගිරිවස්, මිගිඳු, මුවරද, මුවිඳු, සිහ, සී, හරි

15.චන්ද්‍රයා සඳ, උලිඳු, කලානි, කලාපති, ගහරජ, දදරද, පිනිපා, සසක්, සසලේ, සිසි, සරස්, සොමි, හිමකර, හිමරැස්

16.වනය අඩවි, අරණ, අරන්, ඉලු, දඩ, රන්, ලවන්, වල්, වලාන, විපින

17.අවුරුද්ද වසර, වා, වස්, සම්වසර, වර්ෂය

18.නෙලුම කමල, පද්ම, සියපත, පියුම, පොකුරු, සරා

19.සොම්නස් අමොද, තුස්, තිසුම්, තුටු, තොස්, නදන්, මොද, සතුටු, ප්‍රීතිය

20.භූමි දෙරණ, බිම්, මිහි, මී, පොළෝ, පෘථිවි

The National e-learning Portal for The General Education

## ❖ අභ්‍යාස

**<u>පහත දැක්වෙන පදවලට සමානාර්ථ පද ලැයිස්තුවෙන් තෝරා ලියන්න.</u>**

1) ග්‍රන්ථය - ____________________
2) ප්‍රවෘත්තිය - ____________________
3) ඔළුව - ____________________
4) උද්යෝගය- ____________________
5) සමර්ථ- ____________________
6) ශාසනය- ____________________
7) විවිධ - ____________________
8) භාෂාව - ____________________
9) අවසානය- ____________________
10) ප්‍රසාදය- ____________________
11) සමය- ____________________
12) විය - ____________________

**පිළිතුරු**

| | | | | |
|---|---|---|---|---|
| වයස, | කාලය, | අග, | සතුට, | බස, |
| වෙනත්, | සසුන, | සමත්, | උනන්දුව, | |
| හිස, | පුවත, | පොත | | |

e තක්සලාව The National e-learning Portal for The General Education